ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2026.06.16** **චක්‍රලේඛ අංක. 50/2026**

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහය දිසාකොමසාරිස් (පුහුණු) වෙත,**

## <u>පුරෝගාමී පාඨමාලාව</u>

| | |
|---|---|
| **1. දිනය** | **2026 ජුලි මස 17 වන සිකුරාදා දින පෙ.ව. 8.30 සිට**<br>**2025 ජුලි මස 19 වන ඉරිදා දින ප.ව. 5.00 දක්වා** |
| **2. ස්ථානය** | ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානය, මිරිගම |
| **3. පාඨමාලා ගාස්තු** | රු. 3500/- කි. |
| **4. සුදුසුකම්** | බාලදක්ෂ හෝ මානවක බාලදක්ෂ අංශයේ හතරවන අදියර හදාරා තිබීම.<br>2026 වසරට බලපත්‍රය නවීකරණය කර හෝ 2025 වසරට නව බලපත්‍රයක් ලබා තිබිය යුතුයි. |
| **5. අයදුම් පත් භාර ගන්නා අවසන් දිනය** | මේ සමග අමුනා ඇති ඉල්ලුම් පත නිසි ලෙස සම්පූර්ණ කර **2026 ජුනි මස 25 වන දින හෝ එදිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත යොමු කළ යුතු ය.**<br>(පාඨමාලාව සඳහා ඇතුලත් කර ගනු ලබන්නේ අයදුම්කරුවන් 45 ක් පමණක් බැවින් නියමිත දිනට ලැබෙන සුදුසුකම් ලැබූ මුල් අයදුම්කරුවන් 45 දෙනා සඳහා අවස්ථාව ලබා දෙන බව කරුණාවෙන් සලකන්න.) |
| **6. රැගෙන ආයුතු දේ** | **සටහන් තබා ගැනීමට පොතක්,පෑනක්,කඹ වැඩ සඳහා අත් වැසුම් (Glove), ප්‍රායෝගික පුහුණුව සඳහා ඇඳුම්, පිගාන,කෝප්පය හා අවශ්‍ය පෞද්ගලික පරිහරණයට අවශ්‍ය දෑ** |

උක්ත පාඨමාලාව සඳහා ඔබ දිසාවේ සුදුසුකම් ලත් සාමාජිකයින් දැනුවත්කර, මේ සඳහා යොමු කරවන ලෙස මෙයින් දන්වා සිටිමු. එමෙන් ම අවම වශයෙන් එක් දිසාවකින් එක් සාමාජිකයකුගේ සහභාගීත්වය අනිවාර්යය වන අතර පහත නම් සඳහන් දිසාවන්ගෙන් <u>**සාමාජිකයින් දෙදෙනෙකු**</u> සහභාගී කරවීමට කටයුතු කරන්න.

(කොළඹ, මහනුවර, කුරුණෑගල, ගම්පහ, ගාල්ල, යාපනය, කළුතර, මාතර, බදුල්ල, හෝමාගම, කෑගල්ල, මීගමුව, රත්නපුර, වත්තල/ජා-ඇල, අක්කරෙයිපත්තු/කල්මුණේ, මඩකලපුව, මොරටුව/පිළියන්දල සහ පානදුර/හොරණ යන දිසාවන්)

තෝරා ගත් අයදුම්කරුවන් අප විසින් දැනුම් දුන් පසු පාඨමාලා ගාස්තු ගෙවීමට කටයුතු කරන්න. එමෙන් ම සහභාගීවන්නන්ට ඉදිරියේ දී සෙසු විස්තර දැනුම් දීමට අපේක්ෂා කරමු.

සියළු විමසීම් කටයුතු පාඨමාලා නායක **මිහිර ප්‍රණීත් මහතාගේ (0773 854938)** දුරකථනයෙන් විමසීමට කාරුණික වන්න.

ස්තූතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

*කර්නල් පද්මලාල් පෙරේරා*
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

*නිතීඥ මනෝජ් නානායක්කාර*
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

<u>පිටපත් -</u> 1. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළු ම කොමසාරිස්වරුන්
2. සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
3. ලිපි ගොනුවට


ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131 / +94 11 2 433 512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk